ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි

2019 ඔක්තෝබර් 22

දයාබර දෙමව්පියන් වෙත,

<u>දහම් පාසල ආරම්භයේදී පැනවූ කොන්දේසි කඩකිරීම</u>

වසර 2016 දෙසැම්බර් මස අවාසනාවන්ත ලෙස දහම් පාසල වසා දැමීමට සිදුවූකාරණා, ඒ පිළිබඳව දහම් පාසලේ සංවිධායක මණ්ඩලය ගත් ක්‍රියාමාර්ග සහ දහම් පාසල නැවත ආරම්භ කිරීම සඳහා අප ලබාගත් විශේෂ අවසරය පිළිබඳව, අප එකඟ වූ ගිවිසුම අනුව දෙමාපියන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි සම්බන්දව ඔබතුමා / ඔබතුමිය දැනුවත් කළ අතර, එම කොන්දේසි නොපිරිහෙලා පිළිපදින බවට සහතික කල කොන්දේසි පත්‍රිකාව අත්සන් කර අපට භාරදුන් බව ඔබ ඉතා හොඳින් දන්නා කරුණකි.

එනමුත්, ඔබ විසින් මෙම කොන්දේසි කඩකරමින් ඔබගේ දරුවා දහම් පාසලට ගෙන ඒම / රැගෙන යාම සිදුකරමින් <u>දහම් පාසලේ පැවැත්මට හානිවන අයුරින් කටයුතු කොට ඇති බව</u> අපට වාර්තා වී ඇත.

එවැනි කොන්දේසි කඩකිරීමකදී ඔබ කටයුතු කලයුතු ආකාරය ඔබ අත්සන් කල කොන්දේසි මාලාවේ සඳහන්ව ඇති බැවින් අප ඔබට නැවත මතක් කිරීමට අවශ්‍ය නැති බව අපගේ විශ්වාසයයි.

> *“සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති කොන්දේසි මාලාවට එකඟ වන බවටත්, දහම් පාසලේ දූ දරුවන් සහ දෙමාපියන් සඳහා පනවා ඇති විනය නීති මාලාව පිළිපදින බවටත්, <u>ඉහත සඳහන් එක් කොන්දේසියක් හෝ කඩකරන පළමු අවස්ථාවේදීම දරුවාගේ දහම් පාසලේ ශිෂ්‍ය භාවය අහෝසි කිරීමට දහම් පාසලේ සංවිධායක මණ්ඩලයට සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවට පූර්ණ බලය ඇති බව</u> පිළිගන්නා අතර කිසිම කාරණයක් මත දරුවා නැවත දහම් පාසලට ඇතුළත් කර නොගන්නා බවද පිළිගනිමි. තවද මෙම ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවේ තීරණ අවසන් තීරණ බවද පිළිගනිමි.”*

කෙසේ නමුත් දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ අවසාන තීරණය ගැන ඔබ සමග සාකච්චා කිරීමට තීරණය කෙරුණු අතර ඒ සඳහා **<u>2019 ඔක්තෝම්බර් මස 25 වැනිදා, සිකුරාදා පෙරවරු 09:00 ට</u>** දහම් පාසලට පැමිණ අප සංවිධායක මණ්ඩලය හමුවන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල

**Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.**
**TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org**